www.agaram.lk

OL/2015/60-S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**60 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2015**

| | |
|---|---|
| ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II | පැය තුනයි |
| வணிகக் கல்வியும் கணக்கீடும் I, II | மூன்று மணித்தியாலம் |
| Business and Accounting Studies I, II | Three hours |

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

**සැලකිය යුතුයි:**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

● පහත සඳහන් සිද්ධිය කෙරෙහි අවධානය යොමු කරමින් අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කෘෂිකාර්මික කටයුතු සම්බන්ධ අත්දැකීම් බහුල, ග්‍රාමීය ප්‍රදේශයක ජීවත්වන ගෘහණියක වන කරුණාවතී, තම පවුලේ සාමාජිකයින්ට නැවුම් එළවළු ලබා දීම සඳහා තම ගෙවත්තේ එළවළු වගා කරන්නී ය. ඇගේ දියණිය වන සමාධි පිපිඤ්ඤා සහ තක්කාලිවලට අධි රුචිකත්වයක් දක්වයි. කරුණාවතී පවුලේ පරිභෝජනයට ප්‍රමාණවත් එළවළු තබාගෙන අතිරික්තය අසල සති පොළෙහි වෙළෙඳුන්ට විකුණා ලාභ ලබයි.

**1.** මෙම සිද්ධියේ ඇතුළත් වන මිනිස් අවශ්‍යතාවක් සහ ඊට අදාළ වුවමනාවක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) තක්කාලි - ආහාර (2) ආහාර - පිපිඤ්ඤා (3) ආහාර - සෞඛ්‍ය (4) පිපිඤ්ඤා - තක්කාලි

**2.** ඉහත සිද්ධිය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) කරුණාවතී සෘජු නිෂ්පාදනයේ පමණක් යෙදේ.
(2) කරුණාවතී වක්‍ර නිෂ්පාදනයේ පමණක් යෙදේ.
(3) කරුණාවතී සෘජු හා වක්‍ර නිෂ්පාදනයේ යෙදේ.
(4) සමාධි වක්‍ර නිෂ්පාදනයේ යෙදේ.

**3.** මෙම සිද්ධියේ සඳහන් වන කරුණාවතීගේ ව්‍යාපාරයේ අවස්ථාවක් වන්නේ,
(1) කරුණාවතී කෘෂිකාර්මික කටයුතු සම්බන්ධයෙන් ලබා ඇති අත්දැකීම් ය.
(2) කරුණාවතී ගෘහණියක් වීම ය.
(3) කරුණාවතීට විශාල ගෙවත්තක් තිබීම ය.
(4) කරුණාවතීගේ නිවස ආසන්නයේ සති පොළක් පැවතීම ය.

**4.** මෙම සිද්ධියේ සඳහන් වන සති පොළ
(1) රාජ්‍ය අංශයේ තෘතීයික නිෂ්පාදන ව්‍යාපාරයකි.
(2) රාජ්‍ය අංශයේ ප්‍රාථමික නිෂ්පාදන ව්‍යාපාරයකි.
(3) පෞද්ගලික අංශයේ ප්‍රාථමික නිෂ්පාදන ව්‍යාපාරයකි.
(4) පෞද්ගලික අංශයේ ද්විතීයික නිෂ්පාදන ව්‍යාපාරයකි.

**5.** මෙම සිද්ධියේ සඳහන් නිෂ්පාදිත බෙදාහැරීමේ ක්‍රියාවලිය නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) කරුණාවතී → පාරිභෝගිකයා

(2) සති පොළේ වෙළෙන්දා → පාරිභෝගිකයා

(3) කරුණාවතී → සති පොළේ වෙළෙන්දා → පාරිභෝගිකයා

(4) සති පොළේ වෙළෙන්දා → සිල්ලර වෙළෙන්දා → පාරිභෝගිකයා

**6.** "වැඩිහිටියන් සඳහා විශේෂ දිනයක් ප්‍රකාශයට පත් කිරීම" මෙම ප්‍රකාශයෙන් හැඟවෙන ව්‍යාපාර පරිසරය කුමක් ද?
(1) ආර්ථික පරිසරය (2) දේශපාලන පරිසරය
(3) සමාජ හා සංස්කෘතික පරිසරය (4) තාක්ෂණික පරිසරය

[දෙවැනි පිටුව බලන්න.

099852
Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



7. සංජීව දිසානායක සහ ධම්මික දිසානායක විසින් "දිසානායක සහෝදරයෝ" නමින් සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරයි. මෙම ව්‍යාපාරය සම්බන්ධ පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මෙය කේවල ස්වාමි ව්‍යාපාරයකි.
(2) මෙම ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.
(3) මෙම ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම අනිවාර්ය නොවේ.
(4) මෙම ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවය ලැබේ.

8. පහත X තීරුවේ ව්‍යාපාර සැලැස්මක අන්තර්ගත කොටස් ද, Y තීරුවේ එම එක් එක් කොටසේ ඇතුළත් අයිතමය බැගින් ද දැක්වේ.

| X | Y |
|---|---|
| 1. අලෙවි සැලැස්ම | A - අපේක්ෂිත පුහුණු කිරීමේ වියදම් |
| 2. මෙහෙයුම් සැලැස්ම | B - අපේක්ෂිත ප්‍රචාරණ වියදම් |
| 3. මානව සම්පත් සැලැස්ම | C - අපේක්ෂිත ප්‍රාග්ධනය |
| 4. මූල්‍ය සැලැස්ම | D - අපේක්ෂිත නිෂ්පාදන ඒකක ගණන |

X තීරුවේ සඳහන් ව්‍යාපාර සැලැස්මක අන්තර්ගත කොටස්, Y තීරුවේ සඳහන් අයිතම සමග අනුපිළිවෙළින් ගැළපූ විට ලැබෙන පිළිතුර වන්නේ,
(1) A, B, C හා D ය. (2) B, C, A හා D ය. (3) B, D, A හා C ය. (4) B, D, C හා A ය.


● පහත තොරතුරු ඇසුරෙන් අංක **9** හා **10** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
පාසල් බෑග් නිෂ්පාදනය කර අලෙවි කිරීමට අපේක්ෂිත ව්‍යාපාරයක 2016 ජනවාරි මාසයේ ඇස්තමේන්තුගත වියදම් පහත දැක්වේ.

| | |
|---|---|
| * මුළු නිෂ්පාදන පිරිවැය | රු. 120 000 |
| * සෘජු ශ්‍රම පිරිවැය | රු. 20 000 |
| * සෘජු වෙනත් වියදම් | රු. 10 000 |
| * සෘජු ද්‍රව්‍ය පිරිවැය | රු. 60 000 |

9. මෙම ව්‍යාපාරයේ අපේක්ෂිත නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය වන්නේ,
(1) රු. 30 000 කි. (2) රු. 60 000 කි. (3) රු. 90 000 කි. (4) රු. 210 000 කි.

10. ජනවාරි මාසය තුළ පාසල් බෑග් 200 ක් නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කරයි නම් පාසල් බෑගයක අපේක්ෂිත පිරිවැය වන්නේ,
(1) රු. 150 කි. (2) රු. 300 කි. (3) රු. 450 කි. (4) රු. 600 කි.

● අංකනය කරන ලද චෙක්පතක් සහ චෙක්පතකට අදාළ යෙදුම් කිහිපයක් පහත දැක්වේ. එම තොරතුරු ඇසුරෙන් අංක **11** සහ **12** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




A - වටිනාකම අකුරෙන් B - දිනය
C - ආදායකයාගේ නම D - බැංකු ශාඛාවේ අංකය
E - ගිණුම් හිමියාගේ නම F - ගිණුම් අංකය

11. ඉහත චෙක්පතේ ①, ②, ③ හා ④ යන අංක සඳහා නිවැරදි යෙදුම් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) C, A, B, D (2) C, A, B, F (3) E, A, B, D (4) E, A, B, F

[තුන්වැනි පිටුව බලන්න.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



**12.** ඉහත චෙක්පතේ අංක ⑤ න් දැක්වෙන කොටසට අදාළ **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) එය චෙක්පතේ පිළිපත වේ.
(2) එහි ඉහත B හා C ඇතුළත් කෙරේ.
(3) එහි 015129 යනු චෙක්පතේ අංකය වේ.
(4) එය චෙක්පත බැංකුවේ තැන්පත් කිරීමේ දී භාවිත කරන මූලාශ්‍ර ලේඛනය වේ.

**13.** රෙදිපිළි ව්‍යාපාරයක් පවත්වාගෙන යන කුමාරි, දමිත්ගෙන් රු. 100 000 ක් වටිනා රෙදි තොගයක් මිල දී ගත් අතර, ඒ සඳහා කුමාරි චෙක්පතක් නිකුත් කරන ලදී. මෙම ගනුදෙනුව සඳහා කුමාරිට තිබිය යුත්තේ,
(1) ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමකි.
(2) ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ජංගම ගිණුමකි.
(3) මහජන බැංකුවේ ජංගම ගිණුමකි.
(4) මහජන බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමකි.

**14.** හර කාඩ්පතක් සම්බන්ධ පහත ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) හර කාඩ්පත ණය පදනම මත නිකුත් කරයි.
(2) හර කාඩ්පතක් ලබා ගැනීමට බැංකු ගිණුමක් අවශ්‍ය නොවේ.
(3) හර කාඩ්පතකින් කරනු ලබන ගෙවීම් සඳහා පොලියක් අය කෙරේ.
(4) හර කාඩ්පතක් ගනුදෙනුකරුගේ තැන්පතුවේ වටිනාකම මත නිකුත් කරයි.

**15.** තම පියාට අයත් ලොරි රථය තමාගේ ව්‍යාපාරික කටයුතු සඳහා යොදාගන්නා තරිඳු එම රථය තමාගේ නමින් රක්ෂණය කිරීමට අයදුම්පතක් රක්ෂණ සමාගමකට ඉදිරිපත් කරන ලදී. රක්ෂණ සමාගම එය ප්‍රතික්ෂේප කර ඇත. මෙයට හේතු වූ රක්ෂණ මූලධර්මය වනුයේ,
(1) රක්ෂ්‍ය හිමිකමයි. (2) හානිපූරණයයි. (3) උපරිම විශ්වාසයයි. (4) ආදේශනයයි.

**16.** ඉන්ධන පිරිමැසුම්දායක වාහනයක් වන දෙමුහුන් (Hybrid) මෝටර් රථ සඳහා වර්තමානයේ ඉහළ ඉල්ලුමක් පවතී. මෙම ප්‍රකාශය තුළ ඇතුළත් වන ප්‍රවාහන මූලිකාංග වන්නේ,
(1) මාර්ගය හා මාධ්‍යයයි. (2) මාධ්‍යය හා බලයයි.
(3) බලය හා පර්යන්තයයි. (4) මාර්ගය හා පර්යන්තයයි.

**17.** සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග පහත දැක්වේ.

| | |
|---|---|
| A - මාධ්‍යය | B - ලබන්නා |
| C - ප්‍රතිපෝෂණය | D - පණිවුඩය |
| E - යවන්නා | F - ප්‍රතිචාරය |

සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග නිවැරදි පිළිවෙළට දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) E, D, A, B, C, F (2) E, D, A, B, F, C (3) E, A, D, B, F, C (4) E, D, A, F, B, C

**18.** පහත සඳහන් සිද්ධීන් අතුරෙන් බාහිර, වාචික, විද්‍යුත් සන්නිවේදනයක් වන්නේ,
(1) ක්‍රීඩා උත්සවය සඳහා ආරාධනා පත්‍ර අවට පාසල්වලට යැවීම ය.
(2) ශිෂ්‍යයන්ගේ ප්‍රගති වාර්තා පොත් දෙමව්පියන්ට ලබා දීම ය.
(3) අසනීප වූ ශිෂ්‍යයකු පිළිබඳ ව විදුහල්පති විසින් දුරකථනයෙන් දෙමව්පියන්ට දැන්වීම ය.
(4) ශබ්ද විකාශන යන්ත්‍රයෙන් විදුහල්පති පාසලේ රැස්වීම ඇමතීම ය.

**19.** රුවන්, සමාගමක එකක් රු. 50 බැගින් වූ සාමාන්‍ය කොටස් 1 000 ක් මිලට ගෙන මසකට පසු එකක් රු. 70 බැගින් විකුණන ලදී. මෙම ගනුදෙනුවෙන් ඔහු ලැබූ ප්‍රතිලාභය වන්නේ,
(1) රු. 20 000 ක පොලී ආදායමකි. (2) රු. 20 000 ක ලාභාංශයකි.
(3) රු. 20 000 ක ප්‍රාග්ධන ලාභයකි. (4) රු. 70 000 ක ප්‍රාග්ධන ලාභයකි.

**20.** ඉතිරි කිරීමේ තැන්පතුවල ආයෝජනය කිරීමට සාපේක්ෂව සමාගමක සාමාන්‍ය කොටස්වල ආයෝජනය කිරීම ---①--- අවදානමක් සහිත වන අතර ---②--- ප්‍රතිලාභයක් ද සහිත වේ.
ඉහත ප්‍රකාශයේ ① හා ② ස්ථානවලට අදාළ නිවැරදි යෙදුම් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ඉහළ, ඉහළ (2) ඉහළ, පහළ
(3) පහළ, ඉහළ (4) පහළ, පහළ

**21.** ව්‍යාපාරයේ කඩකුලී වියදම රු. 8 000 ක් මුදලින් ගෙවීම, මූලික ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

| | වත්කම් | = | අයිතිකරුගේ හිමිකම | + | වගකීම් |
|---|---|---|---|---|---|
| (1) | + 8 000 | = | + 8 000 | | – |
| (2) | – 8 000 | = | – 8 000 | | – |
| (3) | – | = | + 8 000 | | – 8 000 |
| (4) | – | = | – 8 000 | | + 8 000 |

[හතරවැනි පිටුව බලන්න.

agaram.lk
Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !

www.agaram.lk



099852

**22.** ලෙජරයේ ඇති ණයගැති ගිණුම ................①................ වන අතර, ලද වට්ටම් ගිණුම ................②................ වේ.
ඉහත ① හා ② ස්ථානවලට අදාළ නිවැරදි යෙදුම් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) වගකීම් ගිණුමක්, ආදායම් ගිණුමක්
(2) වගකීම් ගිණුමක්, වියදම් ගිණුමක්
(3) වත්කම් ගිණුමක්, ආදායම් ගිණුමක්
(4) වත්කම් ගිණුමක්, වියදම් ගිණුමක්

**23.** පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක ලෙජරයෙන් උපුටාගත් ගිණුමකි.

.................... ගිණුම

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 01/15 | මුදල් ගිණුම | | 6 000 | 01/01 | ශේෂය | | 5 000 |
| | ලද වට්ටම් | | 600 | 01/10 | ගැනුම් ගිණුම | | 10 000 |
| 01/31 | ශේෂය ප/ගෙ | | 8 400 | | | | |
| | | | 15 000 | | | | 15 000 |
| | | | | 02/01 | ශේෂය ඉ/ගෙ | | 8 400 |

මෙම ගිණුමේ නම හා මෙම ගිණුම අයත් වන ගිණුම් වර්ගය පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ණයහිමි ගිණුම, වගකීම් ගිණුම්
(2) ණයගැති ගිණුම, වගකීම් ගිණුම්
(3) මුදල් ගිණුම, වත්කම් ගිණුම්
(4) ණයගැති ගිණුම, වත්කම් ගිණුම්

**24.** ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත X තීරුවේ ද, මූලික පොත්වල එම ගනුදෙනු සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛන පහත Y තීරුවේ ද දැක්වේ.

| X | Y |
|---|---|
| 1. ප්‍රසන්න රු. 3 000 ක භාණ්ඩ ආපසු එවීම | A - හරපත |
| 2. කීර්තිට රු. 5 000 ක භාණ්ඩ ආපසු යැවීම | B - ලදුපත |
| 3. රු. 50 000 ක් වටිනා යන්ත්‍රයක් ණයට ගැනීම | C - බැරපත |
| 4. ණයගැතියකුගෙන් රු. 10 000 ක මුදල් ලැබීම | D - ජ'නල් වවුචරය |

X තීරුවේ සඳහන් ගනුදෙනු, Y තීරුවේ සඳහන් මූලාශ්‍ර ලේඛන සමග නිවැරදි අනුපිළිවෙළට ගැළපූ විට ලැබෙන පිළිතුර වන්නේ,
(1) A, C, B හා D ය. (2) C, A, B හා D ය. (3) C, A, D හා B ය. (4) C, B, A හා D ය.

**25.** ව්‍යාපාරයක දුන් වට්ටම් රු. 800 කින් වැඩිවීමට හේතු වන ගනුදෙනුව තෝරන්න.
(1) රු. 8 000 ක ණයහිමියකු වූ ජානකට 10% ක වට්ටමකට යටත් ව මුදල් ගෙවීම
(2) රු. 4 000 කට මිල ලකුණු කළ භාණ්ඩයක් රු. 3 200 කට අත්පිට මුදලට විකිණීම
(3) රු. 1 000 ක ණයගැතියකු වූ රුවන්ගෙන් රු. 800 ක් මුදල් ලැබීම
(4) රු. 8 000 ක ණයගැතියකු වූ කපිලගෙන් 10% ක වට්ටමකට යටත් ව මුදල් ලබා ගැනීම

**26.** මූලික සටහන් පොත් සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ව්‍යාපාරයේ සියලු ම ණයට ගැනුම්, ගැනුම් ජ'නලයේ සටහන් කෙරේ.
(2) ආපසු එවුම් ජ'නලයේ ගනුදෙනු සටහන් කිරීමට උපයෝගී කර ගන්නා මූලාශ්‍ර ලේඛනය හරපතයි.
(3) ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා යන්ත්‍රයක් ණයට ගැනීම පොදු ජ'නලයේ සටහන් කෙරේ.
(4) ගනුදෙනුවක් සටහන් කිරීමට සුවිශේෂී මූලික පොතක් නැති අවස්ථාවක එය සටහන් කරනුයේ මුදල් පොතේ ය.

**27.** ව්‍යාපාරයක සුළු මුදල් සම්බන්ධ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.
* 2015.01.01 දිනට සුළු මුදල් භාරකරු අත ඇති මුදල රු. 200
* 2015.01.01 දින සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම රු. 1 800
* 2015.01.31 දිනට සුළු මුදල් භාරකරු අත ඉතිරි මුදල රු. 300

ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම සහ ජනවාරි මාසයේ සුළු මුදල් වියදම පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) රු. 2 000, රු. 1 500
(2) රු. 1 800, රු. 1 500
(3) රු. 1 800, රු. 1 700
(4) රු. 2 000, රු. 1 700

**28.** බැංකු ප්‍රකාශනයක හර තීරුවේ දැක්වෙන අයිතමයක් වන්නේ,
(1) ණයගැති ප්‍රේෂණ ය. (2) මුදල් තැන්පතු ය. (3) චෙක්පත් තැන්පතු ය. (4) බැංකු ගාස්තු ය.

● පහත තොරතුරු ඇසුරෙන් අංක **29** හා **30** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනුවක් සහ එය ගිණුම්ගත කර ඇති ආකාරය දැක්වෙන ද්විත්ව සටහන පහත දැක්වේ.

ගනුදෙනුව : රු. 50 000 ක් වටිනා කාර්යාල උපකරණ අත්පිට මුදලට ගැනීම
ද්විත්ව සටහන : කාර්යාල වියදම් ගිණුම හර රු. 50 000
මුදල් ගිණුම බැර රු. 50 000

**29.** ඉහත ගනුදෙනුව ගිණුම්ගත කිරීමේ දී සිදු වී ඇති ගිණුම්කරණ දෝෂය කුමක් ද?
(1) අතිරික්තතා දෝෂ (2) ඌනතා දෝෂ (3) මූලධර්ම දෝෂ (4) හිලව් දෝෂ

[පස්වැනි පිටුව බලන්න.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



30. ඉහත වරද නිවැරදි කිරීමේ ජ'නල් සටහන කුමක් ද?
(1) කාර්යාල උපකරණ ගිණුම හර රු. 50 000
මුදල් ගිණුම බැර රු. 50 000
(2) කාර්යාල උපකරණ ගිණුම හර රු. 50 000
කාර්යාල වියදම් ගිණුම බැර රු. 50 000
(3) අවිනිශ්චිත ගිණුම හර රු. 50 000
කාර්යාල වියදම් ගිණුම බැර රු. 50 000
(4) කාර්යාල උපකරණ ගිණුම හර රු. 50 000
අවිනිශ්චිත ගිණුම බැර රු. 50 000

31. ව්‍යාපාරයක් විසින් 2013.01.01 දින මිලට ගත් යන්ත්‍රයක පිරිවැය රු. 100 000 ක් වූ අතර එහි ඵලදායී ජීවිත කාලය අවු. 05කි. එම කාලය අවසානයේ සුන්බුන් අගය රු. 10 000 කි. 2014.12.31 දිනට යන්ත්‍ර ක්ෂය වෙන් කිරීමේ ගිණුමේ ශේෂය වන්නේ,
(1) රු. 18 000 කි. (2) රු. 20 000 කි. (3) රු. 36 000 කි. (4) රු. 40 000 කි.

32. 2014.01.01 දින සුමුදුගේ ව්‍යාපාරය 15% ක වාර්ෂික පොලියක් ගෙවන ස්ථාවර තැන්පතුවක රු. 200 000 ක් ආයෝජනය කර ඇත. 2014 වර්ෂය තුළ දී රු. 20 000 ක ආයෝජන ආදායමක් මුදලින් ලැබී ඇත. මෙම ව්‍යාපාරයේ 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ ලාභාලාභ ගිණුමේ දැක්වෙන ආයෝජන ආදායම කොපමණ ද?
(1) රු. 10 000 (2) රු. 20 000 (3) රු. 30 000 (4) රු. 220 000

- පහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන අංක **33** හා **34** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

එක්සත් ක්‍රීඩා සමාජයේ 2014 වර්ෂයේ සාමාජික සංඛ්‍යාව 120 දෙනෙකු වන අතර එක් අයකුගේ මාසික සාමාජික ගාස්තුව රු. 50 කි. 2014 වර්ෂය තුළ දී සාමාජිකයින් 100 දෙනෙකු වාර්ෂික සාමාජික ගාස්තුව ගෙවා ඇත.

33. 2014.12.31 දිනට හිඟ සාමාජික මුදල කොපමණ ද?
(1) රු. 1 000 (2) රු. 6 000 (3) රු. 12 000 (4) රු. 60 000

34. මෙම ක්‍රීඩා සමාජයේ 2014 වර්ෂයේ සාමාජික මුදල් ආදායම කොපමණ ද?
(1) රු. 6 000 (2) රු. 12 000 (3) රු. 60 000 (4) රු. 72 000

- පහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන අංක **35** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

2014.01.01 දින ආරම්භ කරන ලද කල්හාරාගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2014.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| විකුණුම් .............................. | | 180 000 |
| ගැනුම් .............................. | 100 000 | |
| ආපසු එවුම් .............................. | 5 000 | |
| ආපසු යැවුම් .............................. | | 9 000 |
| ඉඩම් .............................. | 450 000 | |
| ගොඩනැගිලි කුලී .............................. | 24 000 | |
| ප්‍රචාරණය .............................. | 15 000 | |
| විදුලි ගාස්තු .............................. | 18 000 | |
| 10% බැංකු ණය .............................. | | 50 000 |
| බැංකු පොලී .............................. | 2 000 | |
| ණයගැතියෝ .............................. | 20 000 | |
| ණයහිමියෝ .............................. | | 15 000 |
| අතැති මුදල් .............................. | 30 000 | |
| බැංකු අයිරාව .............................. | | 10 000 |
| ප්‍රාග්ධනය .............................. | | 400 000 |
| | 664 000 | 664 000 |

අමතර තොරතුරු :
1. 2014.12.31 දිනට තොගය රු. 30 000 කි.
2. 2014.12.31 දිනට උපචිත විදුලි ගාස්තු රු. 2 000 කි.

35. මෙම ව්‍යාපාරයේ 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය වනුයේ,
(1) රු. 61 000 කි. (2) රු. 70 000 කි. (3) රු. 91 000 කි. (4) රු. 100 000 කි.

36. මෙම ව්‍යාපාරයේ 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභය වනුයේ,
(1) රු. 84 000 කි. (2) රු. 105 000 කි. (3) රු. 114 000 කි. (4) රු. 119 000 කි.

[හයවැනි පිටුව බලන්න.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



**37.** මෙම ව්‍යාපාරය 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ ලාභාලාභ ගිණුමේ දැකිය හැකි විකිණීමේ හා බෙදාහැරීමේ වියදමක් වනුයේ,

(1) ප්‍රචාරණ ගාස්තු ය.
(2) විදුලි ගාස්තු ය.
(3) ගොඩනැගිලි කුලී ය.
(4) බැංකු පොලී ය.

**38.** මෙම ව්‍යාපාරයේ 2014.12.31 දිනට අයිතිකරුගේ හිමිකම වනුයේ,

(1) රු. 50 000 කි. (2) රු. 350 000 කි. (3) රු. 400 000 කි. (4) රු. 450 000 කි.

**39.** 2014.12.31 දිනට මෙම ව්‍යාපාරයේ ජංගම වගකීම්වල වටිනාකම වනුයේ,

(1) රු. 20 000 කි. (2) රු. 25 000 කි. (3) රු. 27 000 කි. (4) රු. 30 000 කි.

**40.** මෙම ව්‍යාපාරයේ 2014.12.31 දිනට ශේෂ පත්‍රයේ දැක්වෙන මුළු වත්කම්වල වටිනාකම වන්නේ,

(1) රු. 80 000 කි. (2) රු. 450 000 කි. (3) රු. 500 000 කි. (4) රු. 530 000 කි.

* *

[හත්වැනි පිටුව බලන්න.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

60 S I,II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
Business and Accounting Studies I, II

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

**වැදගත් :** උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න. ඊට වැඩියෙන් ලියා ඇති පිළිතුරු, අයදුම්කරු විසින් කපා හැර නොමැති අවස්ථාවල දී ලකුණු නොකර ම කපා හරිනු ලැබේ.

* **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න **දෙකක් ද**, II කොටසෙන් ප්‍රශ්න **දෙකක් ද**, බැගින් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

**1.** පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක **(i)** සිට **(x)** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අමරසිංහ මුදලින් රු. 50 000 ක් ද, රු. 500 000 ක් වටිනා ලොරි රථයක් ද යොදා ඇඹිලිපිටියේ මී කිරි නිෂ්පාදකයකු වන රසිකගෙන් මුදවපු මී කිරි හට්ටි මිල දී ගෙන කොළඹ පිහිටි රජයේ ආයතනවල ආපණ ශාලාවලට බෙදා හැරීමේ ව්‍යාපාරයක් "අමරස මී කිරි" නමින් 2015.01.01 දින ආරම්භ කරන ලදී. එදින ම රු. 20 000 ක් තැන්පත් කර ජංගම ගිණුමක් ආරම්භ කරන ලදී. මිල දී ගත් මුදවපු මී කිරි හට්ටි සඳහා මාසය අවසානයේ දී චෙක්පතක් මගින් ගෙවීම කරනු ලබන අතර, ආපණ ශාලා හිමියන්ට එම කිරි හට්ටි අත්පිට මුදලට සපයයි.

2015 ජනවාරි මාසයේ සිදු වූ ගනුදෙනුවලට අදාළ තොරතුරු පහත දැක්වේ.

* මුදවපු කිරි හට්ටියක ගැනුම් මිල රු. 20 ක් වන අතර විකුණුම් මිල රු. 30 කි.
* ගැනුම් - කිරි හට්ටි 20 000
* ලොරි රථ රියදුරාගේ වැටුප ගෙවීම රු. 25 000
* කිරි හට්ටි ප්‍රවාහනයේ දී අවශ්‍ය වන බහාලුම් මිල දී ගැනීමට ගෙවීම රු. 20 000
* ඉන්ධන හා වෙනත් වියදම් ගෙවීම් රු. 40 000
* ලොරි රථ සරල මාර්ග ක්‍රමයට වාර්ෂික ව 12% බැගින් ක්ෂය කරයි.
* මාසය අවසානයේ තොග කිසිවක් ඉතිරි වී නොමැත.
* මාසය තුළ දී ජංගම ගිණුමේ තැන්පත් කළ මුදල රු. 500 000 කි.

පෙබරවාරි මාසයේ සිට මුදවපු කිරි හට්ටි කොළඹ හා අවට නගරවලට ද බෙදාහැරීමට අපේක්ෂා කරන අතර, එමගින් මසකට විකුණනු ලබන කිරි හට්ටි ගණන 5% කින් ඉහළ යනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. තව ද මේ සඳහා නව ලොරි රථයක් මිල දී ගැනීමට ද අදහස් කරයි.

(i) (අ) ඉහත සිද්ධියේ සඳහන් නිෂ්පාදිතය මගින් සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාව කුමක් ද?
(ආ) "අමරස මී කිරි" ව්‍යාපාරය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

(ii) මෙහි සඳහන් නිෂ්පාදිතය බෙදාහැරීමේ ක්‍රියාවලිය ගැලීම් සටහනක් මගින් දක්වන්න.

(iii) (අ) මෙම ව්‍යාපාරය සඳහා ලබාගත යුතු යැයි ඔබ යෝජනා කරන රක්ෂණ ඔප්පුවක නමක් ලියන්න.
(ආ) ජංගම ගිණුමක් මගින් ජංගම ගිණුම් හිමියකුට ලබාගත හැකි, මෙම සිද්ධියේ සඳහන් වන වාසියක් ලියන්න.

(iv) මෙම ව්‍යාපාරය පුළුල් කිරීමට අවශ්‍ය වන ලොරි රථය මිල දී ගැනීම සඳහා අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගත හැකි විධිමත් ක්‍රම **දෙකක්** ලියන්න.

(v) (අ) පෙබරවාරි මාසයේ අපේක්ෂිත විකුණුම් ඒකක ගණන කොපමණ ද?
(ආ) පෙබරවාරි මාසයේ අපේක්ෂිත විකුණුම් ආදායම කොපමණ ද?

(vi) 2015.01.01 දිනට මෙම ව්‍යාපාරයේ ප්‍රාග්ධනය යෙදීම ගිණුම්ගත කිරීමට අදාළ ද්විත්ව සටහන ලියන්න.

(vii) (අ) මෙම සිද්ධියේ සඳහන් වන ජංගම ගිණුම ආශ්‍රිත ගනුදෙනු **දෙකක්** ලියන්න.
(ආ) ඉහත (අ) හි ගනුදෙනු ගිණුම්ගත කිරීමට අදාළ වන මූලාශ්‍ර ලේඛන ලියන්න.
(පිළිතුරු සැපයීමේ දී පහත ආකාරයේ ආකෘතියක් භාවිත කරන්න.)

| (අ) ගනුදෙනුව | (ආ) මූලාශ්‍ර ලේඛනය |
|---|---|
| 1. | 1. |
| 2. | 2. |

(viii) (අ) මෙම සිද්ධියේ සඳහන් අයභාර වියදමක් අගයයන් සහිත ව ලියන්න.
(ආ) මෙම සිද්ධියේ සඳහන් ප්‍රාග්ධන වියදමක් අගයයන් සහිත ව ලියන්න.

(ix) 2015 ජනවාරි මාසය සඳහා මෙම ව්‍යාපාරයේ මුදල් පොතේ බැංකු තීරුව පිළියෙල කරන්න.

(x) 2015.01.31 දිනට "අමරස මී කිරි" ව්‍යාපාරයේ මුදල් ශේෂය ගණනය කරන්න.

(ලකුණු 02 × 10 = 20 යි)

[අටවැනි පිටුව බලන්න.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

**2.** (i) අවශ්‍යතා හා වුවමනා යන්න වෙන වෙන ම නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) හිමිකාරත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කර දක්වන්න.

(ආ) ඔබ ප්‍රදේශයේ ඇති තැපැල් කාර්යාලය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත් වේ ද? (ලකුණු 02 යි)

(iii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) ස්වභාව ධර්මයෙන් ලැබී ඇති සම්පත් ඒ ආකාරයෙන් ම උකහා ගැනීම ද්විතීයික නිෂ්පාදනය වේ.

(ආ) එළවළු වගා කරන ගොවියකු ඒවා ඔහු විසින් ම පාරිභෝගිකයින්ට ලබා දීම ඍජු නිෂ්පාදනය වේ.

(ඉ) ව්‍යාපාර සැලැස්මක ඇතුළත් කරනුයේ පුරෝකථනය කරන ලද තොරතුරු ය.

(ඊ) සමාගමක් සංස්ථාපනය කිරීම මගින් එම ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවය හිමි වේ. (ලකුණු 02 යි)

(iv) ජයපාල වේවැල් පුටු නිෂ්පාදනය කර අලෙවි කිරීමට අදහස් කරයි. 2016 ජනවාරි මාසයේ දී වේවැල් පුටු 50 ක් නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වන අතර ඒ සඳහා රු. 40 000 ක වේවැල් ද, පුටු සාදන්නාගේ මාසික වැටුප රු. 10 000 ක් ද, මාසික විදුලි ගාස්තුව රු. 6 000 ක් ද, මාසික කඩකුලී වියදම රු. 4 000 ක් ද දැරීමට සිදු වේ යැයි ඇස්තමේන්තු කර ඇත.

(අ) මෙම ව්‍යාපාරයේ අපේක්ෂිත ඍජු පිරිවැය හා වක්‍ර පිරිවැය කොපමණ ද?

(ආ) පුටුවක අපේක්ෂිත නිෂ්පාදන පිරිවැය කොපමණ ද? (ලකුණු 02 යි)

(v) සුමනා තම පරිභෝජනය සඳහා අර්තාපල් කිලෝග්‍රෑම් එකක් තම ප්‍රදේශයේ පිහිටි දීපාගේ එළවළු වෙළෙඳසැලෙන් මිල දී ගන්නා ලදී. දීපාගේ මිතුරකු වන ධනපාල, වැලිමඩ අල ගොවීන්ගෙන් විශාල තොග වශයෙන් අර්තාපල් මිල දී ගෙන දීපාගේ වෙළෙඳසැලට සපයයි.

(අ) ඉහත සිද්ධියේ සඳහන් අතරමැදියන් **දෙදෙනකුගේ** නම් ලියන්න.

(ආ) රජය විසින් ආනයනය කරනු ලබන අර්තාපල් සඳහා ආනයන බදු ඉහළ දැමීම වැලිමඩ අල ගොවීන්ට කෙසේ බලපායි ද යන්න දක්වන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 10 යි)

**3.** (i) චෙක්පතක් යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ii) (අ) ඔබේ පාසලේ භාවිත කරනු ලබන අභ්‍යන්තර, ලිඛිත සන්නිවේදන ක්‍රම **දෙකක්** ලියන්න.

(ආ) ව්‍යාපාර කටයුතු සඳහා සන්නිවේදනය වැදගත් වීමට හේතු **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(iii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) චෙක්පතක මුහුණත සඳහන් කර ඇති සමාන්තර රේඛා දෙක අතර වාණිජ බැංකුවක නමක් සඳහන් වීම විශේෂ රේඛනයයි.

(ආ) ස්වර්ණාභරණ උකස්කරුවකුට උකසට ගත් රන් භාණ්ඩ සඳහා රක්ෂ්‍ය හිමිකමක් ඇත.

(ඉ) පණිවුඩ, තොරතුරු හෝ අදහස් ආයතනයක පුද්ගලයන් අතර යම් මාධ්‍යයක් හරහා හුවමාරු කර ගැනීම බාහිර සන්නිවේදනයයි.

(ඊ) කොළඹ වරාය ප්‍රවාහන මූලිකාංගයක් වන පර්යන්තයකි. (ලකුණු 02 යි)

(iv) ඉසුරු තම ව්‍යාපාරයට මිල දී ගත් මොටර් රථය සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සමාගමේ රක්ෂණය කරන ලදී.

(අ) මෙහි රක්ෂකයා හා රක්ෂිතයා පිළිවෙළින් ලියන්න.

(ආ) රක්ෂණය හා ආරක්ෂණය අතර වෙනස්කමක් ලියන්න. (ලකුණු 02 යි)

(v) බණ්ඩාර යාපනයෙන් මිදි තොග වශයෙන් එකතු කර දුම්රිය මගින් ඒවා කොළඹට ප්‍රවාහනය කර, තම වෑන් රථය මගින් කොළඹ පිහිටි පලතුරු කඩවලට බෙදා හරියි.

(අ) මෙහි සඳහන් වන ප්‍රවාහන මාර්ග හා ඊට අදාළ මාධ්‍ය සඳහන් කරන්න.

(ආ) බණ්ඩාර ඔහුගේ ම වෑන් රථයෙන් යාපනයේ සිට කොළඹට මිදි ප්‍රවාහනය නොකර ඉහත සඳහන් පරිදි ප්‍රවාහනය කිරීමෙන් ඔහු ලබන වාසියක් ලියන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 10 යි)

**4.** (i) ආයෝජන කළඹක් යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ii) (අ) සමුපකාර සමිතියකට මූල්‍ය සම්පාදනය කරගත හැකි ආකාර **දෙකක්** ලියන්න.

(ආ) වාණිජ බැංකුවක පවත්වාගෙන යනු ලබන තැන්පතු වර්ග **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(iii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) සාමාන්‍ය කොටස්වල ආයෝජනය කරන්නෙකුට නිශ්චිත ලාභාංශයක් හිමි වේ.

(ආ) කොළඹ කොටස් වෙළෙඳපොළේ කටයුතු අධීක්ෂණය කරනු ලබන්නේ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව මගිනි.

(ඉ) ආයෝජකයකු, සාමාන්‍ය කොටස් ගත් මිලට වඩා වැඩි මිලකට විකිණීමෙන් ලබන ලාභය ප්‍රාග්ධන ලාභ වේ.

(ඊ) පැහැදිලි නෛතික පදනමකින් යුතු ව සංවිධානාත්මක ස්වරූපයෙන් සිදු වන ආයෝජන විධිමත් ආයෝජන වේ. (ලකුණු 02 යි)

(iv) මුදිත කුලියට ගත් ගොඩනැගිල්ලක මුද්‍රණ ආයතනයක් පවත්වාගෙන යයි. එහි සේවකයින් හතරදෙනෙකු සේවය කරන අතර මුද්‍රණ කටයුතු සඳහා නවීන මුද්‍රණ යන්ත්‍රයක් මිල දී ගැනීමට අදහස් කරයි.

(අ) මෙම ව්‍යාපාරයේ කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා **දෙකක්** ලියන්න.

(ආ) ඉහත ව්‍යාපාරයේ සේවකයකු වන රජිත හවුල්කරුවකු ලෙස මෙම ව්‍යාපාරයට සම්බන්ධ වීමට අදහස් කරයි. මෙමගින් ව්‍යාපාරයට ඇති වන නව මූල්‍ය සම්පාදන මාර්ග **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

[නවවැනි පිටුව බලන්න.

agaram.lk

Agaram.lk - Keep your dreams alive !

Agaram.lk - Keep your dreams alive !

www.agaram.lk



(v) සහෝදරියන් වන අමා හා පබා ලොතරැයි දිනුමකින් ලද රු. 100 000 ක මුදල දෙදෙනා සම සම ව බෙදාගෙන විධිමත් ආයෝජන මාර්ගවල ආයෝජනය කරන ලදී. වර්ෂයකට පසු අමා ප්‍රාග්ධන ලාභයක් ලැබූ බවත්, පබා පොලී ආදායමක් ලැබූ බවත් පැවසූහ.

(අ) අමා ආයෝජනය කරන්නට ඇතැයි ඔබ සිතන ආයෝජන මාර්ගය හේතු සහිත ව ලියන්න.

(ආ) පබා ආයෝජනය කරන්නට ඇතැයි ඔබ සිතන ආයෝජන මාර්ගය හේතු සහිත ව ලියන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 10 යි)

## II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

**5.** (i) පහත දැක්වෙන්නේ වෙළෙඳ ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කිහිපයකි.

(අ) අයිතිකරු රු. 50 000 ක මුදලක් ප්‍රාග්ධනය ලෙස යෙදවීම

(ආ) රු. 25 000 ක බැංකු ණය මුදලක් ලබා ගැනීම

(ඉ) රු. 15 000 ක බඩු තොගයක් ණයට ගැනීම

(ඊ) රු. 3 000 ක මාසික විදුලි බිල්පත ගෙවීම

(උ) රු. 100 000 ක ලී බඩු, මොරටු ලී බඩු වෙළෙඳුන්ගෙන් ණයට ගැනීම

**අවශ්‍ය වන්නේ:**

ඉහත එක් එක් ගනුදෙනුවට අදාළ මූලාශ්‍ර ලේඛනය හා එම ගනුදෙනුව හර වන ගිණුම හා බැර වන ගිණුම ලියා දක්වන්න. (පිළිතුරු සැපයීමේ දී පහත ආකාරයේ ආකෘතියක් භාවිත කරන්න. පළමු ගනුදෙනුව ඔබ වෙනුවෙන් සටහන් කර දක්වා ඇත.)

| ගනුදෙනුව | මූලාශ්‍ර ලේඛනය | හර වන ගිණුම | බැර වන ගිණුම |
|---|---|---|---|
| (අ) | ලදුපත | මුදල් ගිණුම | ප්‍රාග්ධන ගිණුම |
| (ආ) | | | |
| (ඉ) | | | |
| (ඊ) | | | |
| (උ) | | | |

(ලකුණු 04 යි)

(ii) 2015.03.31 දිනට කැලුම්ගේ ව්‍යාපාරයේ පිළියෙල කළ ශේෂ පිරික්සුම තුලනය නොවූ අතර, එහි වෙනස වූ රු. 4 000 අවිනිශ්චිත ගිණුමකට බැර කරන ලදී. පසුව පහත වැරදි අනාවරණය විය.

A - එරංග විසින් ආපසු එවූ රු. 1 000 ක භාණ්ඩ අදාළ ගිණුම් දෙකෙහි ම හරට සටහන් වී ඇත.

B - රු. 8 000 ක විකුණුම් ඉන්වොයිසියක් විකුණුම් ජ'නලයේ සටහන් කර ඇත්තේ රු. 800 ක් ලෙස ය.

C - රු. 2 400 ක රක්ෂණ ගාස්තු ගෙවීම මුදල් පොතේ පමණක් සටහන් කර ඇත.

D - ලැබූ පොලී රු. 2 200 ක් මුදල් පොතේ නිවැරදි ව සටහන් කර ඇතත් ගෙවූ පොලී ගිණුමට හර කර ඇත.

**අවශ්‍ය වන්නේ:**

(අ) ඉහත වැරදි නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන්

(ආ) අවිනිශ්චිත ගිණුම (ලකුණු 06 යි)

(මුළු ලකුණු 10 යි)

**6.** (i) දිලෙන තරු ක්‍රීඩා සමාජයේ 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ ලැබීම් හා ගෙවීම් ගිණුම පහත දැක්වේ.

ලැබීම් හා ගෙවීම් ගිණුම

| | (රු.) | | (රු.) |
|---|---|---|---|
| 2014.01.01 ශේෂය | 22 000 | ක්‍රීඩා උපකරණ මිල දී ගැනීම | 30 000 |
| සාමාජික මුදල් ලැබීම් | 80 000 | විදුලි ගාස්තු ගෙවීම | 6 000 |
| මුදල් පරිත්‍යාග ලැබීම් | 8 500 | වානේ අල්මාරියක් ගැනීම | 12 000 |
| | | ක්‍රීඩා පිටිය නඩත්තු වියදම් | 10 500 |
| | | 2014.12.31 ශේෂය ප/ගෙ | 52 000 |
| | 110 500 | | 110 500 |

අමතර තොරතුරු:

* දිලෙන තරු ක්‍රීඩා සමාජයේ සාමාජික සංඛ්‍යාව 200 ක් වූ අතර එක් අයෙකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 500 කි.

**අවශ්‍ය වන්නේ:**

(අ) 2014.12.31 දිනට හිඟ සාමාජික මුදල

(ආ) 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන මෙම ක්‍රීඩා සමාජයේ ආදායම් හා වියදම් ගිණුමේ ඇතුළත් වන වියදම් අයිතම **දෙකක්** නම් කිරීම

(ඉ) ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයක පිළියෙල කරනු ලබන 'ලැබීම් හා ගෙවීම් ගිණුමත්,' 'ආදායම් හා වියදම් ගිණුමත්' අතර වෙනසක්මක් ලියන්න. (ලකුණු 03 යි)

[දහවැනි පිටුව බලන්න.

agaram.lk
Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !

www.agaram.lk



(ii) අමාලිගේ ව්‍යාපාරයේ 2015 සැප්තැම්බර් මාසයේ මුදල් පොතේ බැංකු තීරුව පහත දැක්වේ.

මුදල් පොත

| දිනය | ලදු. අං. | විස්තරය | ස. පි. | වටිනාකම රු. | දිනය | ච. අ. | විස්තරය | ස. පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 09/01 | | ඉ/ගෙ ශේෂය | | 3 500 | 09/02 | | චෙක් - 153161 | | 2 000 |
| 09/03 | | මුදල් තැන්පතු | | 6 000 | 09/08 | | චෙක් - 153162 | | 800 |
| 09/10 | | චෙක් තැන්පතු | | 4 500 | 09/15 | | චෙක් - 153163 | | 3 400 |
| 09/18 | | චෙක් තැන්පතු | | 6 400 | 09/20 | | චෙක් - 153164 | | 2 100 |
| 09/25 | | මුදල් තැන්පතු | | 5 000 | 09/26 | | චෙක් - 153165 | | 1 500 |
| 09/28 | | චෙක් තැන්පතු | | 1 800 | 09/30 | | ශේෂය ප/ගෙ | | 17 400 |
| | | | | 27 200 | | | | | 27 200 |

අමාලිගේ ව්‍යාපාරයට බැංකුව විසින් එවනු ලැබූ 2015 සැප්තැම්බර් මාසය සඳහා වූ බැංකු ප්‍රකාශනය පහත දැක්වේ.

| දිනය | විස්තරය | ගෙවීම් (රු.) | ලැබීම් (රු.) | ශේෂය (රු.) |
|---|---|---|---|---|
| 09/01 | ශේෂය ඉ/ගෙ | – | – | 3 500 |
| 09/03 | මුදල් තැන්පතු | – | 6 000 | 9 500 |
| 09/05 | චෙක් ගෙවීම් - 153161 | 2 000 | – | 7 500 |
| 09/10 | චෙක් ගෙවීම් - 153162 | 800 | – | 6 700 |
| 09/12 | චෙක් තැන්පතු | – | 4 500 | 11 200 |
| 09/15 | ණයගැති ප්‍රේෂණ | – | 2 000 | 13 200 |
| 09/17 | චෙක් ගෙවීම් - 153163 | 3 400 | – | 9 800 |
| 09/20 | චෙක් තැන්පතු | – | 6 400 | 16 200 |
| 09/25 | මුදල් තැන්පතු | – | 5 000 | 21 200 |
| 09/26 | චෙක් ගෙවීම් - 153164 | 2 100 | – | 19 100 |
| 09/27 | බැංකු ගාස්තු | 100 | – | 19 000 |
| 09/30 | ස්ථාවර නියෝග - රක්ෂණ ගාස්තු | 4 200 | – | 14 800 |

**අවශ්‍ය වන්නේ:**

(අ) සංශෝධිත මුදල් පොත

(ආ) බැංකු සැසඳුම් ප්‍රකාශය

(ලකුණු 07 යි)

(මුළු ලකුණු 10 යි)

7. තරිඳුගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2014.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ප්‍රාග්ධනය .................................... | | 500 000 |
| ආරම්භක තොගය (2014.01.01 දිනට) .............. | 30 000 | |
| ගැනුම් .................................... | 300 000 | |
| විකුණුම් .................................... | | 450 000 |
| ණයගැතියෝ.................................... | 45 000 | |
| ණයහිමියෝ .................................... | | 20 000 |
| 10% බැංකු ණය .................................... | | 50 000 |
| ඉඩම් හා ගොඩනැගිලි (පිරිවැයට) .................. | 400 000 | |
| යන්ත්‍ර (පිරිවැයට) .................................... | 120 000 | |
| විදුලි ගාස්තු .................................... | 12 000 | |
| පරිපාලන වේතන .................................... | 30 000 | |
| ගැනිලි .................................... | 5 000 | |
| ප්‍රචාරණ ගාස්තු .................................... | 10 000 | |
| බෙදාහැරීමේ වියදම .................................... | 12 000 | |
| බැංකු ණය පොලී.................................... | 4 000 | |
| අතැති මුදල .................................... | 52 000 | |
| | 1 020 000 | 1 020 000 |

අමතර තොරතුරු:

* 2014.12.31 දිනට තොගයේ පිරිවැය රු. 12 500 කි.
* යන්ත්‍ර සරල මාර්ග ක්‍රමයට වාර්ෂික ව 10% බැගින් ක්ෂය කළ යුතු ය.
* ණයගැතියන්ගෙන් රු. 1 000 ක් බොල්ණය ලෙස කපාහැරිය යුතු ය.

**අවශ්‍ය වන්නේ:**

(i) 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා තරිඳුගේ ව්‍යාපාරයේ වෙළෙඳ හා ලාභාලාභ ගිණුම (ලකුණු 05 යි)

(ii) 2014.12.31 දිනට ශේෂ පත්‍රය (ලකුණු 05 යි)

(මුළු ලකුණු 10 යි)

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk